**ශීර්ෂය 165 - ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය, ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

ශීර්ෂය 165 - ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල වීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 සැප්තැම්බර් 17 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1:3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.11 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත

සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම.<br>(දෙපාර්තමේන්තු කටයුතු සිදු කළ යුත්තේ හුදෙක් මූල්‍ය හා දෙපාර්තමේන්තු නියෝගවලට අනුකූලව පමණක් නොව, රාජ්‍ය කටයුතු ඉටු කිරීමේදී බලාපොරොත්තුවන අවංකභාවය පිළිබඳ උසස් තත්ත්වයන්ට අනුකූල බව) | 1. ක්‍රියාකාරී සැලැස්මේ කාර්යයන් ඉටු නොකිරීම<br>2. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම<br>3. ප්‍රසම්පාදන කටයුතු සැලසුම් කිරීමේ අඩුපාඩු | 2.1.1<br>2.7<br>2.2.1 (අ) |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. අනුකූල නොවීම්<br>2. විගණන හා කළමනාකරණ කමිටු නොපැවැත්වීම.<br>3. මානව සම්පත් කළමනාකරයේ අඩුපාඩු. | 2.8<br>2.10<br>2.11 |

| | | | |
|---|---|---|---|
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු<br><br>අභ්‍යන්තර විගණනය | 2.2.1 (ආ) (ඇ)<br><br>2.9 |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වනු පිණිස සැකයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්න තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම. | වෙනත් කළමනාකරණයේ දුර්වලතා | 2.3 |
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම් විධිවූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම. | 1. වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තු සභාගත නොකිරීම<br>2. අග්‍රිම ගිණුමේ අඩුපාඩු<br>3. බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු | 2.1.2<br><br>2.5<br>2.6 |
| 127(5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලැකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව | 1. සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම<br>2. අධි ප්‍රතිපාදන සලසා තිබීම | 2.4(i)<br><br>2.4(ii) |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

---------------------------------------------

### 2.1 කාර්යසාධනය

---------------

#### 2.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

------------------------------

**ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යයන් ඉටු නොකිරීම**

------------------------------------------------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශය විසින් කාර්යයන් 19 ක් ඉටු කළ යුතුව තිබුණත්, ඉන් කාර්යයන් 14 ක් පමණක් ඉටු කර තිබුණි. එසේ ඉටු නොකළ කාර්යයන් 05 ක් සඳහා එකතුව රු.මිලියන 181.5ක ප්‍රතිපාදන සලසා තිබුණි.

**2.1.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2018 අගෝස්තු 16 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම**

අමාත්‍යාංශය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා ලබා ගත යුතු වූ රු. මිලියන 8.41 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 7.71 ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| වැය විෂය | වැය විෂය විස්තරය | සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය |
|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| | **සැපයීම්** | | | |
| 1201 | - ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 2.03 | 2.02 | 0.01 |
| 1203 | - ආහාර පාන හා නිල ඇඳුම් | 0.35 | 0.34 | 0.01 |
| 1205 | - වෙනත් | 0.03 | 0.03 | - |
| | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | | | |
| 2102 | - ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 1.50 | 1.50 | - |
| 2103 | - යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ | 4.50 | 3.82 | 0.68 |
| | එකතුව | 8.41 | 7.71 | 0.70 |

**2.2.1 ප්‍රසම්පාදනයන් සැලැසුම් කිරීම**

**(අ) ප්‍රසම්පාදන සැලැසුම් කිරිම සහ ප්‍රාරම්භක අවධිය**

සමාලෝචිත වර්ෂය සඳහා විදේශාධාර සහයෝගිතා, ආයෝජන හා කාර්ය මණ්ඩල පුහුණු යන ප්‍රාග්ධන වැය විෂයයන් හැර අනෙකුත් ප්‍රාග්ධන වියදම රු.268,843,080ක් වුවද, රු. 8,325,000 කට පමණක් ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබුණි. එසේ වුවද සකස්කර තිබූ ප්‍රසම්පාදන සැලැස්ම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.(ඉ) මාර්ගෝපදේශයේ අවශ්‍යතාවයන් ඉටුකර නොතිබුණි.

**(ආ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 3.4 හා 3.2 ප්‍රකාරව මිල සැඳහුම් ක්‍රමය හෝ විවෘත තරඟකාරී මිල ගණන් කැඳවීමෙන් තොරව, 2016 වර්ෂයේදී ප්‍රසම්පාදන කටයුතු සිදුකර ගෙන තිබූ ආයතනවලින්ම සමාලෝචිත වර්ෂයේදී වටිනාකම රු.4,533,238 ක ප්‍රසම්පාදනයන් 03 ක් සිදුකර තිබුණි.

(ii) කලාව හා සංස්කෘතිකමය භාවිතයන් හරහා රට තුල සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම සඳහා වූ වැඩසටහන්හි අවසාන අදියර යටතේ ජාතික සමගිය හා සංහිඳියා කාර්යංශය විසින් විවිධ තේමාවන් යටතේ අයිතම 08 ක් ඇතුළත් ග්‍රන්ථ 31,500 ක් හා සහතික පත්‍ර 12,050 මුද්‍රණය කිරීමේ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1.(අ) වගන්තිය ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 3.2 පරිදි විවෘත තරඟකාරී මිල ගණන් කැඳවීමෙන් තොරව මුද්‍රණ දෙපාර්තමේන්තුවෙන් සකස්කල රු.6,465,000 ක ඇස්තමේන්තු මුදලකට සෘජුවම මෙම මුද්‍රණ කටයුත්ත එම දෙපාර්තමේන්තුව වෙත පවරා දී තිබුණි.

(ඇ) (i) චාර්ල්ස් දයානන්ද මහතාගේ කාටූන් චිත්‍ර 100 ක් ඇතුළත් ග්‍රන්ථයේ පිටපත් 10,000ක් මුද්‍රණය කිරීම සඳහා ඇස්තමේන්තුව රු.1,780,000 ක් වූ අතර, පසුව එම පොතෙන් මුද්‍රණය කළයුතු පිටපත් ප්‍රමාණය 5,000 ක් දක්වා අඩුකර රු.1,495,000ක් ගෙවා තිබුණි. ඒ අනුව පිටපත් ප්‍රමාණය අඩුවන විට රු. 178 ක් වූ වැට් බදු රහිත පොතක පිරිවැය රු. 260 ක් දක්වා සියයට 46 කින් වැඩි කර තිබුණි.

(ii) උක්ත මුද්‍රණ කාර්යය 2017 අගෝස්තු 31 දිනට අවසන් විය යුතු වුවත්, 2018 ඔක්තෝබර් මාසය වන විට මුද්‍රණය කර තිබූ පොත් සංඛ්‍යාව 3,805 ක් පමණක් වූ අතර ඉන් පොත් 950 ක් ජාතික සමඟිය හා සංහිඳියා කාර්යාංශය වෙත නිකුත් කර තිබුණි. මුද්‍රණය කර තිබූ ඉතිරි පොත් තොගය 2018 ඔක්තෝබර් 08 දින දක්වාම අමාත්‍යාංශය ලබාගෙන නොතිබුණි.

**2.3 වත්කම් කළමනාකරණය**

වත්කම් සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) ඉන්ධන දහනයවීම් පරීක්ෂා නොකිරීම**

2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනයවීම් පරීක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා චක්‍රලේඛයේ 3.1.6 ඡේදය ප්‍රකාරව 2018 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් එම වාර්තා 2018 ඔක්තෝබර් 10 දින ඉදිරිපත් කර තිබුණි.

(ඇ) **වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයට අයත් Land cruser මෝටර් රථය පවරා ගැනීමකින් තොරව ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන අමාත්‍යාංශයේ ලේකම් විසින් 2016 නොවැම්බර් සිට 2018 අගෝස්තු 24 දින දක්වාම භාවිතා කර තිබුණි.

## 2.4 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 03ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2015 | පුනරාවර්තන | 29.24 | 5.83 | 23.41 | 80 |
| | මූලධන | 3.56 | 0.79 | 2.77 | 78 |
| | **එකතුව** | **32.80** | **6.62** | **26.18** | **80** |
| 2016 | පුනරාවර්තන | 76.99 | 46.62 | 30.37 | 39 |
| | මූලධන | 320.21 | 290.73 | 29.48 | 9 |
| | **එකතුව** | **397.20** | **337.35** | **59.85** | **15** |
| 2017 | පුනරාවර්තන | 120.06 | 105.03 | 15.03 | 13 |
| | මූලධන | 3,419.35 | 2,709.52 | 709.83 | 21 |
| | **එකතුව** | **3,539.40** | **2,814.55** | **724.86** | **20** |

සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) **සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

වැය විෂයයන් 02ක් සඳහා සලසා තිබුණු රු. 450,000 මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

(ii) **අධි ප්‍රතිපාදන සලසා තිබීම**

වැය විෂයයන් 17ක් සඳහා එකතුව රු.මිලියන 3194.15 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාල ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 2,478.31 ක් පමණක් උපයෝජනය කිරීම හේතුවෙන් ඉතිරිය රු.මිලියන 715.84 ක්වූ අතර එම ඉතිරිවීම් සලසා

තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11ක සිට සියයට 98ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**2.5 අග්‍රිම ගිණුම**

2017 දෙසැම්බර් 31 දිනට නොපියවූ අග්‍රිම ශේෂයේ වටිනාකම රු.මිලියන 81.90 ක් වූ අතර එය සම්පූර්ණයෙන්ම පියවා තිබුණේ 2018 ජූනි මාසයේදීය.

**2.6 බැංකු ගිණුම් මෙහෙයවීම**

**ගැලපුම් කළ යුතු ශේෂ**

2016 දෙසැම්බර් සහ 2017 ජූලි මාසයන්හිදී නිකුත් කර තිබූ එකතුව රු.137,819 ක් වටිනා චෙක්පත් 2 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.7 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ලැබෙන චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය | මුදල් රෙගුලාසි 451 |
| (ආ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |
| (ඇ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |
| (ඈ) | ඉන්ධන හා ලිහිසි තෙල් ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඈ) |
| (ඉ) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ) |
| (ඊ) | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (උ) | බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 |

**2.8 අනුකූල නොවීම්**

**නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන අමාත්‍යවරයා වෙත අනුයුක්ත කර තිබූ නිල වාහනයක් 2016 ඔක්තෝම්බර් 20 සහ 21 යන දින දෙකෙහිදී රියදුරන් දෙදෙනෙකු අතින් අනතුරුවලට ලක් වී තිබුණද මුදල් රෙගුලාසි 103(1)(අ) ප්‍රකාරව අදාළ බලධාරීන් වෙත වාර්තා කර නොතිබුණි. මුදල් රෙගුලාසි 104(1)(ආ) නියමයට පටහැනිව ප්‍රාරම්භක පරීක්ෂණ කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද වී තිබීම හේතුවෙන් 104(3) ප්‍රකාරව මහා භාණ්ඩාගාරයට වහාම යැවිය යුතු ප්‍රාරම්භක වාර්තාව අනතුර සිදු වී මාස 8 කට පසුවද, මාස තුනක් ඇතුලත ඉදිරිපත් කළ යුතු පූර්ණ වාර්තාව අවුරුදු 1 මාස 5 ක් පමා වී ද ඉදිරිපත් කර තිබුණි.

## 2.9 අභ්‍යන්තර විගණනය

ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් විසින් තම අමාත්‍යාංශවල ස්වකීය රාජකාරී හා වගකීම් ඉටු කිරීම සඳහා අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවා ගත යුතු බව මුදල් රෙගුලාසි 133 මගින් අවධාරණය කර තිබුණද ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

## 2.10 විගණන හා කළමනාකරණ කමිටුව

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(I) දරන විගණන හා කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වර්ෂයකට 4 ක් පැවැත්විය යුතු වුවත් 2017 වර්ෂය තුළ අමාත්‍යාංශය පවත්වා තිබුණේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 2 ක් පමණි.

## 2.11 මානව සම්පත් කළමනාකරණය

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 35.33 ක් වැය කර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 09 | 03 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 01 | 03 |
| (iii) | ද්විතියික මට්ටම | 25 | 14 | 11 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 12 | 12 | - |
| (v) | අනියම්/කොන්ත්‍රාත් | 04 | 01 | 03 |
| | එකතුව | 57 | 37 | 20 |

**කාර්ය මණ්ඩලය පුහුණු කිරීම**

කාර්ය මණ්ඩලය නිතිපතා පුහුණු කිරීමේ අවශ්‍යතාවක් ඇති බැවින් අමාත්‍යාංශය විසින් එහි කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය සඳහා රු.500,000 ක මුදලක් ප්‍රතිපාදනය කර තිබුණ අතර වියදම රු.463,725 ක් වී තිබුණි. එසේ වුවද කිසිදු ආකාරයේ පුහුණුවක් ලබා නොතිබුණු නිලධාරීන් ගණන 28 ක් විය.